**ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය - 2018**
**----------------------------------------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

**----------------------------------**

ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආයතනයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**----------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

**----------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව.

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

-----------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

--------------------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන්කරන ලද වත්කම් සඳහා වූ ගිණුම් කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

------------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රමිත අංක 08 හි 41 ඡේදයේ පරිදි නිශ්චිතව අයභාර උපලබ්ධි වීම හඳුනා නොගෙන 2018 දෙසැම්බර් 31 දිනට රු.14,201,683 ක මුදලක් අමාත්‍යාංශයෙන් ලැබිය යුතු හා ආදායමක් ලෙස ගිණුම් ගත කර තිබුණද, අමාත්‍යාංශය බැරකම් ලෙස දක්වා තිබුණේ රු. 11,973,583 ක් පමණි. | ආයතනයේ වාර්තා අනුව 2018.12.31 දිනට රේඛීය අමාත්‍යාංශයෙන් ලැබිය යුතු මුදල රු.14,201,683 ක් වන අතර වර්ෂයට අදාලව එම මුදල ලැබිය යුතු බව අමාත්‍යාංශය වෙත දන්වා යවා ඇත. | ගිණුම් ප්‍රමිත අනුව අයභාර නිසි ලෙස හඳුනාගෙන ගිණුම්ගත කල යුතු වීම. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද පිරිවැය රු.5,717,770 ක් වූ පරිගණක උපාංග වල තත්‍ය වෙළඳපල අගය මූල්‍ය ප්‍රකාශන වල නිරූපණය නොවන බැවින් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කරන බව දක්වා ඇත. | ස්ථාවර වත්කම් නිසි කාලයේදී ප්‍රත්‍යාගණනය කර තත්‍ය වෙළඳපල අගය මූල්‍ය ප්‍රකාශන වල දැක්විය යුතු වීම. |
| (ආ) වාර්ෂික ගොඩනැගිලි කුලිය රු.17,595,000 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල රු.17,212,500 ක් වශයෙන් දැක්වීමෙන් ගොඩනැගිලි කුලී වටිනාකම රු. 382,500 කින් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි. | එකඟ වන බව දක්වා ඇත. | නිවැරදි වටිනාකම් ගිණුම් ගත කල යුතු වීම. |
| (ඇ) 2017 වර්ෂයේදී ප්‍රත්‍යාගණන වටිනාකම ගිණුම්ගත කිරීමේදී ප්‍රත්‍යාගණනය නොකරන ලද වාහන දෙකෙහි පිරිවැය වූ රු. 2,593,915 ක වටිනාකම වාහන ගිණුමෙන් ඉවත් කර තිබුණි. එසේ වුවද සමාලෝචිත වර්ෂයේදී අදාළ නිවැරදි කිරීම් කර නොතිබුණි. | 2017 වර්ෂයේදී ජනාධිපති ලේකම් කාර්යාලය වෙත භෞතික පවරා දී තිබූ වාහනයේ හිමිකාරීත්වය පවරාගෙන නොතිබුණු බවත්, අනෙක් වාහනය ප්‍රත්‍යාගණනය කර ගිණුම් වලට ඇතුලත් කිරීමට කටයුතු කරන බවත් දක්වා තිබුණි. | වෙනත් ආයතන වෙත වත්කම් පැවරීමේදී ඒවායේ හිමිකාරත්වය එම කාලය තුලදීම පවරා දීමට කටයුතු කල යුතු අතර පවරා දෙන තෙක් අදාල වර්ෂයන් තුල වටිනාකම් ගිණුම්ගත කල යුතු වීම. |

### 1.6 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| නීති රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 371(2) | ලබාදුන් අත්තිකාරම් අදාල කාර්යය නිම කල වහාම පියවිය යුතු වුවද, නිලධාරිනියකට 2018 ඔක්තෝබර් මාසයේදී ලබාදුන් රු.100,000 ක අත්තිකාරම 2018 දෙසැම්බර් 31 දින වනවිටත් පියවීමට කටයුතු කර නොතිබුණි. | නිරීක්ෂණයට එකඟ වෙමි. මේ සම්බන්ධයෙන් නිලධාරීන් දැනුවත් කර ඇති බව දක්වා තිබුණි. | මුදල් රෙගුලාසි නියමයන්ට අනුව අත්තිකාරම් ගෙවීම් සම්බන්ධව කටයුතු කල යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) 2007 අංක 26 දරන ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතන පනත | 2018 දෙසැම්බර් 31 දිනට ඉතුරුම් ගිණුමේ රු.35,711,789 ක ශේෂය කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන කෙටිකාලීන හා දිගුකාලීන සුරැකුම්පත් වල ආයෝජනය කිරීමට කටයුතු කර නොතිබුණි. | කළමනාකරණ මණ්ඩල අනුමැතිය ලබා ගෙන සුරකුම්පත් වල ආයෝජනය කිරීමට කටයුතු කරන බව දක්වා තිබුණි. | විශාල මුදල් ප්‍රමාණයක් අඛණ්ඩව ඉතුරුම් ගිණුම්වල රඳවා ගැනීම නොකල යුතු වීම. |

**2. මූල්‍ය සමාලෝචනය**

------------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

---------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.40,796,685 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අලාභය රු.59,809,832 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.100,606,517 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට වෙනත් ආදායම් රු. 27,425,656 කින් වැඩිවීම හා පරිපාලන හා අනෙකුත් වියදම් රු. 10,915,339 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

--------------------------------

**3.1 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල**

-----------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)මෝටර් රථයක් සඳහා 2017 හා 2018 වර්ෂවලදී අලුත්වැඩියා කටයුතු වෙනුවෙන් පිළිවෙලින් රු.535,639 ක් හා රු.240,963 ක් වැය කර තිබුණද, සමාලෝචිත වර්ෂයේදී ධාවනයේ යොදවා තිබුණේ මාස 03 ක් පමණි. | අලුත්වැඩියා කටයුතු හේතුවෙන් 2018 වර්ෂයේ මාස තුනක් පමණ ධාවන කටයුතු සඳහා යොදා ගෙන තිබුණ බව දක්වා ඇත. | වත්කම් නිසි පරිදි උපයෝජනය කල යුතුය. |
| (ආ)ආයතනය සතු ත්‍රීවිල් රථය 2018 වර්ෂය තුලදී ධාවනයේ යොදවා නොතිබුණි. | රියදුරන් ප්‍රමාණවත් නොවීම මත ත්‍රීවිල් රථය භාවිතයට ගෙන නොමැති බවත් මු.රෙ. 71 යටතේ රියදුරන් දෙදෙනෙකු බඳවා ගැනීම සඳහා ඉල්ලීම් කර ඇති බැවින් ඉදිරියේදී ත්‍රීවිල් රථය භාවිතයට ගත හැකි බව දක්වා ඇත. | ත්‍රීවිල් සඳහා රියදුරන් අනුයුක්ත නොකරන බැවින් ත්‍රීරෝද රථය භාවිතයට ගැනීමට විකල්ප ක්‍රියාමාර්ගයක් ගත යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ)අවශ්‍යතාවය නිසි පරිදි හඳුනා නොගෙන මුද්‍රණය කරන ලද වටිනාකම රු.593,215 ක් වූ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) සම්මන්ත්‍රණ මාලා අත්පොත් 4985 ක් 2018 දෙසැම්බර් 31 දින දක්වාම බෙදා හැරීමට කටයුතුකර නොතිබුණි. | සැලසුම් කල පරිදි අදාල සම්මන්ත්‍රණ පැවැත්වීමට නොහැකි වීම මෙම අත්පොත් ඉතිරි වීමට හේතු වී තිබෙන බවත්, 2019 මැයි මාසය වන විට අත්පොත් 4000 ක් පමණ අ.පො.ස (ස/පෙළ) සිසුන් සඳහා බෙදා අවසන් කර ඇති බවත් දක්වා ඇත. | අවශ්‍යතාවය නිසි පරිදි හඳුනා ගෙන මුද්‍රණ කටයුතු සිදුකල යුතු අතර සම්මන්ත්‍රණ පවත්වන අවස්ථාවේදීම පොත් බෙදාදීමෙන් අපේක්ෂිත අරමුණ ඉටු කර ගත හැකි වේ. |

## 3.2 ප්‍රසම්පාදන කළමනාකරණය

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) 2017 වර්ෂයේ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) දෙවන බස දෙමළ / සිංහල විෂයයට අදාල සම්මන්ත්‍රණ මාලාව පැවැත්වීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.1,553,000 ක් වැය කර අත්පොත් 13,000 ක් මුද්‍රණ කටයුතු සිදුකර ගැනීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.1.1 (අ), 4.3.1 (අ) සහ 2.14.1 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | අත්පොත් සකස් කල පළමු අවස්ථාව මෙය වූ බැවින්, මුල් පිටපත සකස් කර ගැනීමට සිදු වූ ප්‍රමාදය හේතුවෙන් මෙම තත්වය ඇති බවත් ඉදිරියේදී මෙවැනි තත්ත්වයක් ඇති නොවීමට අවශ්‍ය කටයුතු කරන බව දක්වා ඇත. | ප්‍රසම්පාදන කටයුතුවලදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශයන්ට අනුකූලව කටයුතු කල යුතු වීම. |
| (ii)2018 වර්ෂයේදී යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ ප්‍රසම්පාදන කාර්යයන් 5 කදී එකතු වටිනාකම රු.1,728,800 ක් සම්බන්ධයෙන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3.2 (ඇ), 5.3.10 (ආ), 5.3.18 (ආ) හා 6.3.3 (ආ) මාර්ගෝපදේශයන් ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | එකඟ වේ. ඉදිරියේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශය පිළිබඳ පුහුණුවක් අදාල නිලධාරීන්ට ලබා දීමට කටයුතු කරන බව දක්වා ඇත. | -එම- |
| (iii)“දන්නවානම් උගන්වන්න දන්නෙ නැත්නම් ඉගෙන ගන්න.’’ යන තේමාව යටතේ වූ ගුවන්විදුලි වැඩසටහනේ පූර්ව ප්‍රචාරන කටයුතු හා සම්බන්ධීකරණ කටයුතු වෙනුවෙන් පිළිවෙලින් රු.1,559,725 ක් හා රු. 2,564,899 ක් සමාලෝචිත වර්ෂයේදී වැය කර තිබුණද, ඒ සම්බන්ධයෙන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 හා 4.3.1 (ආ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | එකඟ වේ. ඉදිරියේදී ඔබ පෙන්වා දුන් කරුණු වලට අනුව කටයුතු කරන බව දක්වා ඇත. | -එම- |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහ පාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පුහුණු වැඩසටහන් වල කාර්යසාධනය<br>ඇස්තමේන්තුගත වියදම රු. 4,216,900 ක් වූ අධ්‍යයන පොදු සහතිකපත්‍ර (සාමාන්‍ය පෙළ) සිසුන් 8,000 ක් වෙනුවෙන් සම්මන්ත්‍රණ 56 ක් පැවැත්වීමට සැලසුම්කර තිබුණද, ඇස්තමේන්තුගත වියදමෙන් සියයට 64 කට සමාන රු.2,914,948 ක් වැය කර සිසුන් 5,910 ක් වෙනුවෙන් සම්මන්ත්‍රණ 36 ක් පමණක් පවත්වා තිබුණි. | ස්වාභාවික ආපදා හේතුවෙන් සහ වර්ෂ අවසාන විභාග පැවැත්වීම හේතුවෙන් සැලසුම් කල පරිදි එකම කාලවකවානුව තුල සම්මන්ත්‍රණ පැවැත්වීමට නොහැකි වූ බවත් දක්වා තිබුණි. | සම්මන්ත්‍රණ පැවැත්වීමට සැලසුම් කිරීමේදී පාසල් වාර විභාග පිළිබඳ අවධානය යොමු කල යුතු වීම. |

### 4.2 තිරසාර සංවර්ධන අරමුණු

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 ' න්‍යාය පත්‍රය' සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කල යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාලව ආයතනය විසින් ඔවුන්ගේ විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් දැනුවත් වී තිබුණි.එසේ වුවද පහත අඩුපාඩු නිරීක්ෂණය විය.<br>(i) තිරසාර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් උන්දුවක් දක්වන පාර්ශව වෙත දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කර නොතිබුණි.<br>(ii) පාසැල් සිසුන් සඳහා දෙමළ /සිංහල /ඉංග්‍රිසි භාෂා අධ්‍යාපනය ලබාදීම ඉලක්කයක් ලෙස හඳුනාගෙන තිබුණද, අධ්‍යාපන අමාත්‍යාංශය, අරමුණු ක්‍රියාත්මක කිරීමේ ආයතනයක් ලෙස හඳුනාගෙන නොතිබුණි.<br>(iii) තිරසාර සංවර්ධන ඉලක්ක කරා ලඟාවීමේදී අදාල කාර්යයන් නියාමනය කිරීම සඳහා අවශ්‍යවන සංදිස්ථාන හා ක්‍රමවේදයන් හඳුනාගෙන නොතිබුණි. | එකඟ වේ. ඉදිරියේදී අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ. | අදාල චක්‍රලේඛ නියමයන්ට අනුව තිරසාර සංවර්ධන අරමුණු ලඟා කර ගැනීමට ක්‍රියා කල යුතුය. |